**ඩෙංගු වසංගතය සහ බීටී බැක්ටීරියාව සැගවුනු තොරතුරු.**

වෛද්‍යපර්යේෂණායතනයේ කීටවිද්‍යා අංශය මගින්, ඩෙංගු වාහක මදුරු මර්ධනය සඳහා, සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය තාක්ෂණ උපදෙස් සැපයීමට, කීටවිද්‍යා සමීක්ෂණ කරනු ලැබේ. මෙම සමීක්ෂණ මගින්

1) එක් එක් ප්‍රදේශවල ඩෙංගු මදුරුවන් බෝවන ප්‍රධාන ස්ථාන හඳුනා ගැනීම
2) එකී බෝවන ස්ථාන කුමන ප්‍රතිශතයකින් එම ප්‍රදේශවල දක්නට ලැබේද යන බව හඳුනාගැනීම
3) මදුරු ඝනත්වය වැඩිවීමට හැකි කාළ වකවානුව ගැන අනාවැකි පළකිරීම
4) ඩෙංගු මර්ධන කටයුතු වල සාර්ථකත්වය මැනීම
5) එක් එක් ප්‍රදේශවල සිටින මදුරු විශේෂ හඳුනා ගැනීම
6) ඩෙංගු මර්ධනය සඳහා, එක් එක බෝවන ස්ථාන වලට සුදුසු මර්ධන ක්‍රමය සොයා ගැනීම
   යනාදි දත්ත ලබාගනු ලැබේ.

වෛද්‍යපර්යේෂණායතනයේ කීටවිද්‍යා අංශය මගින්, සෑම මසකම, බස්නාහිර පළාතේ, ඩෙංගු රෝගය අධිකව පවතින ප්‍රදේශ 15 ක කීටවිද්‍යා සමීක්ෂණ කරනු ලැබේ. මෙහිදී, නිවාස, පාසැල්, රෝහල්, රජයේ සහ පෞද්ගලික ආයතන, බස් ඩිපෝ, වෙළඳ ව්‍යාපාරික ස්ථාන, ගුවන් තොටුපල සහ වරාය යන ස්ථාන ඇතුළුව, පරිශ්‍ර 3000 ක් පමණ සෑම මසකම පරීක්ෂා කරනු ලැබේ. කීටවිද්‍යා සමීක්ෂණ කරන අතරම, ඩෙංගු වාහක මදුරුවන් බෝවන ස්ථාන හඳුනා ගැනීම සහ එවා ඉවත් කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම කරනු ලැබේ. සමීක්ෂණයකදී ලබා ගන්නා දත්ත, සුදුසු මර්ධන කටයුතු සඳහා, අදාල ප්‍රදේශ වල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක, ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ සහ ජාතික ඩෙංගු මර්ධන එකකය වෙත ලබාදෙනු ලැබේ.

ඩෙංගු වාහක මර්ධනය සඳහා භාවිතා කරන දේශීය හෝ විදේශීය, මදුරු නාශක , විකර්ශක වැනි දෑ,වෙළඳ පලට නිකුත් කිරීමට පෙර, එවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සහතිකයක් පළිබෝධනාශක කාර්යාලය වෙත ලබා දිය යුතු අතර, එම සහතිකය ලබා දෙන එකම ආයතනයද වෛද්‍යපර්යේෂණායතනය වේ.

**ජයග්‍රහන** ඃ වෛද්‍යපර්යේෂණායතනයේ කීටවිද්‍යා අංශය සහ, කාර්මික තාක්ෂණ ආයතනය සමග, ජාතික විද්‍යා පදනමෙන් මුල්‍ය ආධාර පිරිනමන ලද ව්‍යපෘතියකින් කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස, ඩෙංගු කීට මර්ධනය සඳහා, දේශීය බීටී බැක්ටීරියාව සොයාගන්නා ලදි. මේ සඳහා පර්යේෂණ කණ්ඩායමට පේටන්ට් බලපත්‍රය ද හිමිවිය. මෙම පර්යේෂණය සඳහා බොහෝ ප්‍රදේශ වලින් පස් නියැදි ගෙන එම කීට විද්‍යා අංශයේ, කීටවිද්‍යා කණ්ඩායම මගිනද, බැක්ටීරියාවන් පස් නියැදි වලින් වෙන් කිරීම, වැවීම සහ හඳුනා ගැනීමට මුලික පුහුනුව සැපයීම බැක්ටීරියාවේදී අංශයේ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරිනී මගින්ද, ක්ෂේත්‍රයේදී, මදුරු කිටයන්ට විරුද්ධව බැක්ටීරියාවේ ක්‍රියාකාරිත්ය මැනිම, කීටවිද්‍යා කණ්ඩායමේ සහයෝගයෙන් සහ නිශ්පාදිත බැක්ටීරියාව ක්ෂීරපායිනට විස සහිතද නැද්ද යන්න සොයා බැලීම, වෛද්‍යපර්යේෂණායතනයේ පශු වෛද්‍ය නිළධාරිනිය මගින්ද සිදු කරන ලදී.

වර්තමාන පර්යේෂණ - දැනට ඩෙංගු රෝග වාහක මදුරුවන් සඳහා ශ්‍රී ලංකාවේ ශාක භාවිතා කර, විකර්ශකයක් නිශාපාදනය කිරීම සඳහා පර්යේෂණයක් කරගන යනු ලැබේ.